# දැන්වීම් අංකය R/2025/05

**උතුරු පළාත් දෙපාර්තමේන්තුවලට නීති නිලධාරි තනතුරු සඳහා කොන්ත්‍රාත් පතනම යටතේ (පූර්ණ කාලීන) බඳවාගැනීම**

**උතුරු පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ අංක NP/02/02/CS/Gen/2019 දරණ 2025.06.25 දිනය ලිපිය ද ගරු උතුරු පළාත් ආණ්ඩුකාර තුමාගේ අංක GN/NPC/A14/PPS/Legal/2025 දරණ 2025.07.18 දිනයේ අනුමතය ද අනුව පහත සඳහන් දෙපාර්තමේන්තුවලට නීති නිලධාරි තනතුරු සඳහා කොන්ත්‍රාත් පතනම යටතේ (පූර්ණ කාලීන) බඳවාගැනීම සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.**

**ඒ අනුව මෙම දැන්වීමේ සඳහන් කර ඇති සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට ඉල්ලුම් කළ හැක. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා වන සම්මුඛ පරීක්ෂණය ද උතුරුපළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලැබේ. අයදුම් පත්‍ර භාරගනුලබන අවසන් දිනය 2025.08.22 වේ.**

**01. පත්කිරීමට අදාල දෙපාර්තමේන්තුව හා පුරප්පාඩු විස්තර**

| කාර්යාලය | කොන්ත්‍රාත් පතනම යටතේ බඳවාගැනීම් සංඛ්‍යාව |
|---|---|
| ආණ්ඩුකාර තුමාගේ ලේකම් කාර්යාලය | 01 |
| ප්‍රධාන ලේකම්තුමාගේ කාර්යාලය | 01 |

**02. කොන්ත්‍රාත් කාල වකවානුව**

**පත්කරනු ලබන දිනය සිට වසර එක ක කාලය හෝ මෙම තනතුර සඳහා ස්ථිරව නිලධාරියෙකෙනෙක් පත්කරනතෙක් . මේ අතර මුලින්ම එලඹෙන අවස්ථා දිනය දක්වා බල පැවැත්වේ.**

**03. සුදුසුකම්.**

**සාමාන්‍ය සුදුසුකම්**

**(i)** **අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙක් විය යුතුයි.**

**(ii)** **යහපත් හැසිරීම හා කායික හා මානසිකව සෞඛ්‍ය සම්පන්න පුද්ගලයෙක් වන අතර තනතුරට අදාල රාජකාරි ද ඉටුකළ හැකි කායික හැකියාව ද ඇති කෙනෙක් විය යුතුයි.**

**(iii)** **අයදුම්කරු අයදුම් පත් භාරගන්න අවසන් දිනයට පෙරාතුවන වසර හය ක (06) කාලයතුල උතුරු පළාතේ අවම වසයෙන් වසර තුනක (03) කාලයට අඛණ්ඩව ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුයි.**

**නැත්නම්**

**(iv)** **අයදුම්කරු හෝ ඇය/ඔහු ගේ දෙමව්පියන් ද උතුරු පළාතේ උපත ලද අය විය යුත අතර අවම වසයෙන් වසර පහ ක (05) කාලයට උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුයි.**
**(එම ස්ථිර පදිංචි කාලය ද තහවුරු කිරීම සඳහා අදාල ලේඛන ද සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.)**

**04. වයස**

**අයදුම්කරු අයදුම් පත භාරගන්න අවසන් දිනයේ දි වයස වසර 22 ට නො අඩු හා වසර 45 ට නොවැඩි කෙනෙක් විය යුතුයි.**

**05. අධ්‍යාපන සුදුසුකම්.**

**(i)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් නීතිවේදී උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ ලෙස දිවුරුම් දී ඇතිකෙනෙක් විය යුතුයි.

හෝ

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වසර තුනක නීති පාඨමාලාව සම්පූර්ණ කළ ඇති අතර ඒ සඳහා අවසන් විභාගය ද සමත් වී ඇති අතර ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ ලෙස දිවුරුම් දී ඇතිකෙනෙක් විය යුතුයි.

ඒ සමඟ

**(ii)** නීතිඥ ලෙස අවම වසයෙන් වසර තුන ක (3) රැකියා පළපුරුද්දක් ද ඇතිකෙනෙක් විය යුතුයි.

**06.** වැටුප

මෙම තනතුරට ස්ථිර ගෙවීමක් ලෙස (මාසික වැටුප) රු.**99 950/=** ලැබෙයි.

**07.** බඳවාගැනීම් පටිපාටිය

මෙම තනතුර සඳහා බඳවාගැනීම ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා වන අරමුණට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය අනුව පත්කරනු ලැබේ.

**08.** අයදුම්කරන ක්‍රමය

**(iii)** තමන්ගේ සම්පූර්ණ විස්තර සහිත ජීව තත්ත ඇතුලු අයදුම්පත්‍ර ද තමන් ම සකස් කර අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි 'ලේකම් , පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාව , උතුරු පළාත අංක **393/48** , කෝවිල පාර නල්ලූර් යාපනය . යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

**09.** අයදුම්පත්‍රය එවන ලිපි කවරයේ වම් උඩුකෙලවරේ **NP/07/10/01/189** ලෙස සඳහන් කළ යුතුයි.අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ද සුදුසුකම් නිසිලෙස සපුරා නොමැති අයදුම්පත්‍රද ප්‍රතික්ෂෙප කරනු ලැබෙයි.

ආල්වාප්පිල්ලෛ සිරී
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාව ,
උතුරු පළාත.
2025.07.28